# මධ්‍යතන යුගයේ ශ්‍රී ලාංකේය සාහිත්‍ය හා සමකාලීන යුරෝපීය සාහිත්‍ය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් (තෝරා ගත් ගද්‍ය සාහිත්‍ය කෘති ඇසුරින්)

A comparative study of medieval Sri Lankan literature and contemporary European literature (based on selected prose works)

ආචාර්ය දීපචන්දි අබේසිංහ

## Abstract

Looking at the literary history of Medieval Sinhala and European literature, it is clear that the literatures of both these societies are the same in terms of objectives. Like the Sinhalese society during the Medieval period, the European society was completely enmeshed in religious traditions and ideas. Finally, it is revealed that both these literary societies understood that all art, including literature, should be compÈed of a universal work of interpretation. According to the study methods of literary historians, the mÈt popular method is to classify literature into eras and focus on the prominent features of each era. This is a common truth in the context of Sinhala literature as well as in the context of world literature. Any literary work is like a mirror that reflects the current society on the essays of a certain era. This common truth is evident in Sri Lankan media and contemporary European literature no less.

**Keywords:** Middle ages, Medieval Sinhala Literature, Medieval European Literature, Religion, Society

## හැඳින්වීම

ලෝකයේ කවර රටක හෝ ඊටම අදාළ වන නිවැරදි ඉතිහාසයක් ගොඩනගා ගැනීම සඳහා උපකාරී වන මූලාශ්‍ර අතර සාහිත්‍යයට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. සැබවින්ම සාහිත්‍යය නිර්මාණයන්ගෙන් වියුක්තව වංශකතාවක් හෝ ඉතිහාසයක් පවත්වාගෙන යා නොහැකි ය. ජනතාවගේ සභ්‍යත්වයත්, බුද්ධි විකාශයත් විනිශ්චය කිරීමට සාහිත්‍ය කලා උපකාරී වේ. "සාහිත්‍ය වූ කලී සභ්‍යත්වයෙහි වැඩීම, බස දන්න උන්ට පමණක් ඇසෙන සේ කියන්නකි" යනුවෙන් මාර්ටින් වික්‍රමසිංහ කියන්නේ මේ නිසා ය (1997: 01).

සාහිත්‍ය ඉතිහාසඥයන්ගේ අධ්‍යයන ක්‍රම අනුව සාහිත්‍ය යුග වශයෙන් වර්ගීකරණයට ලක් කර ඒ ඒ යුගවල ප්‍රකටව පෙනෙන ලක්ෂණ පිළිබඳ ව අවධානය යොමු කිරීම වඩාත් ප්‍රචලිත ක්‍රමය වේ. එක් එක් කෘතියට වස්තු විෂය වූ තේමා මත සහ ලේඛකයන් අනුගමනය කරන රචනා සම්ප්‍රදායන් මත මෙන් ම සමාජය අනුව ද සාහිත්‍යයේ විවිධත්වයක් විද්‍යාමාන වුවද, අධ්‍යයනය පහසුව සඳහා මේ යුග බෙදීම පිළිගත යුතු ව ඇත. සිංහල සාහිත්‍යය සම්බන්ධයෙන් මෙන් ම ලෝක සාහිත්‍ය සම්බන්ධයෙන් ද මෙය පොදු සත්‍යයකි. සිංහල භාෂා හා සාහිත්‍යයේ ඉතිහාසය සම්බන්ධයෙන් ප්‍රථම වරට විධිමත් පර්යේෂණයක් පවත්වා සම්පාදිත සිංහල ශබ්දකෝෂය, සිංහල භාෂාවේ ව්‍යාකරණය යන ග්‍රන්ථයන්හි කතුවරු සිංහල භාෂා පරිණාමය හා සාහිත්‍ය පරිණාමය යුග හතරකට බෙදා දක්වති (සුරවීර, 1998:3). ඒ ප්‍රාකෘත (ක්‍රි.පූ 2 - ක්‍රි.ව 4 හෝ 5වන සියවස දක්වා), පුරාතන (ක්‍රි.ව 4 හෝ 5වන සියවසේ පටන් ක්‍රි.ව 8වන සියවස දක්වා), මධ්‍යතන හා (ක්‍රි.ව 8 සියවසේ සිට ක්‍රි.ව 13වන සියවස දක්වා), අද්‍යතන යුගය (ක්‍රි.ව 13 සියවසේ මැද භාගයේ පටන් වර්තමානය දක්වා) යනුවෙනි. යුරෝපීය සාහිත්‍යය ඉතිහාසය ද පැරණි යුගය, (ග්‍රීක ශිෂ්ටාචාරයෙන් ඉන් අනතුරු ව රෝම ශිෂ්ටාචාරයක් දියුණුව පැවති ක්‍රි.ව 5වන සියවස දක්වා) මධ්‍යතන යුගය (රෝම ශිෂ්ටාචාරය පරිහානියට පත් වූ 5වන සියවසේ සිට

15වන සියවස දක්වා) නූතන යුගය වශයෙන් කොටස් තුනකට බෙදනු ලැබේ. මේ බෙදීම් සම්බන්ධයෙන් ශාස්ත්‍රීය ලෝකය තුළ වාද විවාද සහ එකිනෙක වෙනස් මතවාද ගණනාවක් පවතින අතර සැලකිය යුතු මට්ටමේ දැනුමක් ද ගොඩනැගී ඇත. මේ ලිපිය මගින් පර්යේෂකයාගේ අවධානය යොමු වන්නේ සාහිත්‍ය සමාජ ඉතිහාසඥයන් මධ්‍යතන නමින් හඳුන්වන යුගයේ ශ්‍රී ලාංකේය සහ යුරෝපීය සාහිත්‍ය පිළිබඳ ආගමික හා සමාජ විද්‍යාත්මක දෘෂ්ටියක පිහිටවමින් විචාරාත්මක විශ්ලේෂණයක් සිදු කිරීමය. මේ යුගයට අයත් සමකාලීන ගද්‍ය සාහිත්‍ය කෘති පමණක් යොදා ගැනීමට බලාපොරොත්තු වේ.

**පර්යේෂණ අරමුණ**

මධ්‍යතන යුගයේ ශ්‍රී ලාංකේය සාහිත්‍ය හා සමකාලීන යුරෝපීය සාහිත්‍ය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් සිදු කිරීමයි.

**පර්යේෂණ ගැටලුව**

මධ්‍යතන යුගයේ ශ්‍රී ලාංකේය සාහිත්‍ය හා සමකාලීන යුරෝපීය සාහිත්‍යයේ සමානතා කවරේද යන්න විමසා බැලීම.

**පර්යේෂණ ක්‍රමවේදය**

මධ්‍යතන යුගයේ ශ්‍රී ලාංකේය සහ යුරෝපීය සාහිත්‍ය පිළිබඳ විචාරාත්මක විශ්ලේෂණයක් සිදු කිරීම මෙම ශාස්ත්‍රීය ලිපියෙහි මූලික අරමුණ විය. ඊට අදාළ පුස්තකාල පර්යේෂණයක් ලෙස සාහිත්‍ය මූලාශ්‍රය යොදා ගනිමින් දත්ත රැස්කිරීම සිදුකරන අතර, විශ්ලේෂණයෙන් මතුකර ගත් කරුණු යටතේ මෙම ලිපිය පෙළගස්වා තිබේ.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

සාහිත්‍ය කලාදිය බිහිවන්නේ මානව ක්‍රියාවලියක ප්‍රතිඵල ලෙසිනි. යම්කිසි වකවානුවක රචනා කළ කවර හෝ සාහිත්‍ය කෘතියක් තත්කාලීන සමාජය සෘජුව ම හෝ ඇතැම්විට වක්‍ර

අයුරින් පිළිබිඹු කරන දර්පණ තලයක් වැන්න. එයට එකල ජීවත් වූ ජනයාගේ සිතුම් පැතුම්, අදහස් උදහස් ජීවන අරගල, පරිසර සම්බන්ධතා වැනි දෑ අඩු වැඩි වශයෙන් අඩංගු විය හැකි ය. ලොව කවරම රටක හෝ කවරම යුගයක හෝ බිහිවන සාහිත්‍ය නිර්මාණයන්හි ප්‍රකට වන මේ පොදු සත්‍යය මධ්‍යකාලීන සිංහල සාහිත්‍යයෙහි මෙන් ම සමකාලීන යුරෝපීය සාහිත්‍යයෙහි ද නොඅඩුව විද්‍යාමාන වෙයි. ඉහතින් සඳහන් කළ පරිදි මෙම ශාස්ත්‍රීය ලිපියෙහි මූලික අරමුණ ආගමික හා සමාජ විද්‍යාත්මක දෘෂ්ටියක පිහිටමින් එකිනෙක වෙනස් කලාප දෙකක බිහි වූ සමකාලීන සාහිත්‍ය පිළිබඳ විචාරාත්මක විශ්ලේෂණය සිදු කිරීම ය. ,මධ්‍යකාලීන සිංහල සමාජය ආගමින් හා පරම්පරාගත බෞද්ධ සම්ප්‍රදායන් සහ අදහස් උදහස් වලින් සම්පූර්ණයෙන්ම වෙළී ගිය එකක් විය (ආරියපාල, 2015: 354). මේ තත්වය අවබෝධ කර ගැනීම අපහසු නොවන්නක් මෙන් ම පුදුම එළවන්නක් ද නොවේ. රාජ්‍ය පාලනය, යුද සංවිධානය, ආගම හා බුද්ධ ශාසනය, අධ්‍යාපනය, ගෘහස්ථ ජීවිතය, රැකි රක්ෂා, චාරිත්‍ර වාරිත්‍ර, කලාව හා විනෝදය ආදී සියලු සමාජ ක්‍රියා පටිපාටියෙන් මෙන්න සමාජීය සංකල්පය ද සම්පූර්ණයෙන් ම රජය හා සම්බන්ධ වූ සංඝයාගේ ආධිපත්‍යයෙහි බලපෑම්වලට යටත් වූ බව ඉතා පැහැදිලිය. සංඝ ආධිපත්‍යය රැක ගැනීම හා එහි ලෞකික පදනම සැපයීම රජය සතු වගකීම විය. ප්‍රාචීන රටවල ඇතිවූ මධ්‍යකාලීන සමාජයත්, ප්‍රතිචීන රටවල ඇති වූ මධ්‍යකාලීන සමාජයත් අතර එක් වැදගත් වෙනසක් දක්නට ලැබිණි. එම වෙනස කවරේදැයි මධ්‍යකාලීන ලංකා සමාජය නම් කෘතියෙහිලා ඇම්. බී. ආරියපාල මෙසේ පැහැදිලි කර දෙයි. සිංහල සමාජය සංවිධානය අතින් වඩා අනම්‍ය වූවා පමණක් නොව, මූලික සමාජීය වෙනස් වීම් ඇති නොවීම නිසා එය මධ්‍යකාලීන යන නමට වඩාත් තදින් හිමිකම් ද කීය. මධ්‍යකාලීන තත්ත්වයේ සිට වර්තමාන තත්ත්වයට වෙනස් වීම කීර්තිධර ඉතිහාසඥයකු විසින් තරාතිරම පදනම් කොටගත් සමාජයක සිට ගිවිසුම් පදනම් කොටගත් සමාජයකට පා තැබීම යැ යි උචිත ලෙස හඳුන්වා දී ඇත. අනික් ලෙසකින් දක්වන්නේ නම්, එකල ඉඩකඩම් හා මනුෂ්‍යයා අතර සම්බන්ධකම නිශ්චය වූයේ මනුෂ්‍යයාගේ තරාතිරම අනුවය. මේ තරාතිරම අනුව, ඒ

ඒ අය යම් යම් වරප්‍රසාදයන්ට හිමිකාරයන් වූ අතර, යුතුකම් හා වගකීම් සමහරක් උසුලන්නට ද ඔවුන්ට සිදුවිය. මේ නම් ප්‍රාචීන ප්‍රතිචීන මධ්‍ය කාලීන සමාජ ද්විත්වයෙහිම පෙනෙන්නට තිබුණු ලක්ෂණයකි. එහෙත් බටහිර රටවල වූ ශිල්ප ශ්‍රේණින් හා වෙළඳ සමාගම් අභ්‍යන්තරයෙහිම විපර්යාස බීජ ගැබ් වී තිබුණි. මේ අයුරින් බලන කල බටහිර වාසීන් විසින් මධ්‍යකාලීන යැ යි හඳුන්වනු ලබන යුගය පැමිණීමටත් පෙර සිටම මධ්‍ය කාලීන ස්වරූපයක් දැරූ ආසියාතික සමාජයේ මෙවැන්නක් නොවීය. මේ ලෙසින් මධ්‍යකාලීන වූ ආසියාතික සමාජයේ මේ මුහුණුවර ගිවිසුම් මත රැඳුනු ආර්ථික තත්ත්වයට මුහුණ පාන තෙක් වෙනස් නොවීය (ආරියපාල, 2014:354).

ලංකාව ද ඇතුළු වන ආසියාතික සමාජයේ අකාලිකත්වයට, හේතු භූත වූ එක් දෙයක් නම් ජීවිතය කෙරෙහි එම සමාජය දැක්වූ නෛසර්ගික ආකල්පයි. ලංකාව දෙස බලන කල ස්වභාවධර්මය පිළිබඳවත් මනුෂ්‍යයාගේ මෝක්ෂය පිළිබඳවත් වූ බෞද්ධ අදහස් අනුසාරයෙන් මේ තත්ත්වය අවබෝධ කරගත හැකි ය. ස්වභාවධර්මය දෙස බෞද්ධයා බැලුවේ ස්වතාන්ඵ දමනයෙන් තමන් අභිබවා ගැනීමෙන් ජයගත යුතු දෙයක් හැටියටය. ලෝකය හුදු මසින් ලෙයින් හා දුෂ්ටත්වයෙන් පිරුණක් පමණක් නොව, මායාවක් ද විය. මධ්‍යකාලීන ශ්‍රී ලාංකේය සාහිත්‍ය කලාවන්ගේ උපදේශනාත්මක ස්වභාවයෙහි මේ ලක්ෂණය මනාව පිළිබිඹු විය. සියලු සංස්කාරයෝ අනිත්‍යයහ. ලාංකේය මධ්‍යකාලීන සාහිත්‍ය කලා ආදියට විෂය වූයේ මේ හිස් බවයි. එහෙයින් මේ කාලයට අයත් සිංහල සාහිත්‍ය කෘතීන් ආගමික ඒවා බව කිව යුතු නොවේ. ජීවිතයේ ලෞකික අංශය උත්කර්ෂයෙන් වර්ණනා කරමින් එහි වූ සෞන්දර්ය පක්ෂය ඇගයූ විදග්ධ සම්භාවනාවට පාත්‍ර වූ ගිහි සම්ප්‍රදාය අභිබවා තම ශ්‍රාවකයින් පාපයට බිය ගන්වා හුදී ජන පහන් සංවේගය පුබුදුවා ස්වර්ග මෝක්ෂ සැප සම්පත් සාදන්නා වූ යති සම්ප්‍රදාය එකල සමාජයේ සියලු ස්ථරයන්ගේ සම්භාවනාවට පාත්‍ර වූ බව අප අමතක නොකළ යුතුය. බුත්සරණ, අමාවතුර, සද්ධර්මරත්නාවලිය ආදී යති සම්ප්‍රදායේ කෘතීන් හි පරමාර්ථය වූයේ, හුදී ජන සමූහයා ප්‍රසාද සංවේගයට පමුණුවා ලෞකික

චේෂ්ඨාවන්ගෙන් වියුක්ත කොට සංසාර ගමන ලුහු කිරීම උදෙසා ධර්මානුශාසනා කිරීමය. නිදර්ශනයක් වශයෙන් ගතහොත් සද්ධර්මරත්නාවලිය කර්මය නැතහොත් හේතුඵල පිළිබඳ විවරණයක් යැයි කිව හැකි ය. එහි ඇතුළත් කතාන්දර පෙන්නුම් කරන්නේ හොඳ ක්‍රියා, සිතුවිලි සහ වචනයත් හොඳ ප්‍රතිඵල ගෙන දෙන බවත්, නරක ක්‍රියා සිතුවිලි හා කියුම් නරක ප්‍රතිඵල ගෙන දෙන බවත්ය. සෑම දෙනා විසින්ම එදිනෙදා ජීවිතයන්හි දී පංචශීලය පිහිටවිය යුතු බව මේ ග්‍රන්ථයෙහි දැක්වෙන සාමාන්‍ය අවවාද අනුශාසනයයි. දානය සහ ශීලය පිළිබඳ මේ ග්‍රන්ථයෙහි එන අදහස් පහත සඳහන් පාඨයෙන් ඒ බව මනාව පැහැදිලි වේ.

...තවද දානය නම් සොරුන්ටවත්, සතුරන්ටවත්, රජදරුවන්ටවත් සාමාන්‍ය නොවන කල කළවුන් තම තමන්ටම ආවේණික ධනයෙක උප නිශ්‍රයව සිට ත්‍රිවිධ බෝධින් එක්තරා බෝධියකත් අධිමුක්ත වූ ලෙසින් සාදා දීලයි යනාදීන් දන් දීමෙහි අනුහස් වදාරාලා... දන් දෙන්නවුන් විසිනුත් දන් දීමට නියැළී නොඉඳ යටත් පිරිසෙයින් පන්සිල් පමණක් වුවත් රැකිය යුතුය. ශීලය නම් මෙලොව පරලොව වැඩට මූලය පැළඳගෙන කොතෙක් ආභරණ ලූවත් සිල් නමැති ආභරණයට වඩන ආභරණයක් නැත...(සද්ධර්මරත්නාවලිය, 1961ඃ 29).

මේ නයින් බලන කල එදා මනුෂ්‍යයාගේ සාමාන්‍ය කල් ක්‍රියාව පමණක් නොව, ජාතික ලක්ෂණ ද බෞද්ධ දර්ශනයේ තියුණු බලපෑම අනුව හැඩගැසුණු බව මනාව ප්‍රත්‍යක්ෂ වේ. මුළු සමාජයම ආගම නමැති බැම්මෙන් වෙලී තිබුණි. සාමාජික වූවද ආර්ථික වුවද දේශපාලනික වුවද සෑම අංගයක් කෙරෙහිම බලපෑවේ ආගමයි. පදනම වූයේ ආගමයි. ආගමික ප්‍රතිපත්තීන් අනුව කටයුතු කිරීම හා ආගම අනුදත් සදාචාර ගුණාංගයන් පුරුදු පුහුණු කිරීම රජුන්ගේ ද යුතුකම විය. බුදුදහමේ පරමාර්ථය පාරිශුද්ධිය වේ. එනම් මිනිස් සිත ලාමක පවිටු ගතිවලින් මුදවාගැනීමය. ලෝභය, ද්වේශය, මෝහය නැති වූ විට පිරිසිදුකම ඇතිවේ.

"අයමෙව බො ආවුසෝ අරියො අට්ඨංගිකො මග්ගො එකස්ස රාගස්ස දොසස්ස මොහස්ස පහානාය සෙයාථීදං: සම්මාදිට්ඨි...සම්මා සමාධි" (සංයුත්ත නිකාය, 710).

ඒ බැවි සද්ධර්මරත්නාවලිය කතුවර ධර්මසේන හිමියන් තම කෘතියෙහිලා මෙසේ සඳහන් කරති. එසේ හෙයින් යම් කෙනෙකුන් නුවණ මදවත් කුශලාච්ඡන්දයෙන් ඇතිව ධර්මාභියෝගයට උපදෙස් ලදින් බණ දැන පින්කමෙහි හැසිර නිවන් සාදා ගනිත් නම් එසේ වූ සත්පුරුෂයන්ට වැඩ සඳහා සද්ධර්මරත්නාවලී නම් ප්‍රබන්ධයක් කරම්හ... ප්‍රයෝජන පමණක් සිතා නුවණ නමැති අස්හි මෝහ නමැති පටලය වැඩී අකුසල් මත වලට වැඳ නිවන් පුරයට ගොසින් තිබූ කුසල් මග නොදැක්කවුන් සද්ධර්මරත්නාවලී නමැති බෙහෙදීන් මෝහ නැමැති පටලය නැති කොට නුවණමය අඳුරු හැර කුසල් මඟවනට බැස නිවන් පුරයට සුවයෙන් යා යුතුය (සද්ධර්මරත්නාවලිය, 1961: 2). යති සම්ප්‍රදායේ ගද්‍ය කාව්‍ය මඟින් මෙසේ බණ දැන පින්කම්හී හැසිර නිවන් සාදා ගැනීම පිණිස ධර්මාවවාද දුන් අතර, එය නුවණැස බැඳුණ මෝහ නමැති පටලය සද්ධර්ම නමැති බෙහෙදින් සුවපත් කොට ගෙන නිර්වාණය ක්ෂාත් ක්ෂාත් කර ගැනීමට ඒකායන මාර්ගය බව සඳහන් කරයි.

ක්‍රි.ව 1200 - 1225 අතර කාලයෙහි රචිත කෘතියක් ලෙස සැලකෙන කර්ම විභාගය බෞද්ධ කර්ම විභාගය සියුම් ලෙස විශ්ලේෂණය කරමින් ලියා ඇති කෘතියකි. රසාස්වාදය පිණිස මෙන් ම ආත්ම විශෝධනය පිණිස ද අනිවාර්යයෙන්ම කියවිය යුතු ග්‍රන්ථයක් වන මෙම කෘතියෙහි ධර්ම කරුණු විග්‍රහ කොට ඇත්තේ සමාජයේ පාරිශුද්ධත්වය අපේක්ෂා කරමිනි. මෙම කෘතිය තත්කාලීන සමාජයේ මානසික පසුබිම හෙළි කරන අතරම අන්තර්ගත කොට ඇති ධර්ම කරුණු මනුෂ්‍ය ප්‍රජාවගේ ආධ්‍යාත්මික ප්‍රභාව සඳහා කවර යුගයකටත් ගැළපෙන්නක් වෙයි. මේ නිදසුන ඒ කරුණ සනාථ කිරීම සඳහා ප්‍රමාණවත් ය."පව් කිරීම නම් කර්තෘ වාක්‍යාර්තව්‍යය නොදන්නා ළදරු වයසේ සිටිය එවුන් කරන දැයක මා වැනි මනා නොමනා බෙදා දන්නා මහළු

වයස සිටියවුන් පව් කරනු නොයෙදෙයි. වයස් ප්‍රත්‍යවේක්ෂා කොට පව් නොකෙරෙත්මය. ශූරතාවයෙහි සිටිය උන් පව් කරන කරනු නොයෙදෙයි. ශූරතාව ප්‍රත්‍යවේක්ෂා කොට පව් නොකෙරෙත්මය" (කර්ම විභාගය, 1961).

ගිහි සම්ප්‍රදාය කෙරෙහි යති සම්ප්‍රදායන්ගේ විරෝධය මැනවින් කැපී පෙනෙන්නේ දඹදෙණි කතිකාවතේහිය. දඹදෙණි කතිකාවත පිහිටුවනු ලැබුණේ මහා සංඝයා වහන්සේගේ අනුමැතිය ඇයද දෙවන පරාක්‍රමබාහු රජතුමා විසිනි.

අප විසින් අමතක නොකළ යුතු කරුණ වන්නේ ගිහිකාව්‍ය සම්ප්‍රදායේ අග්‍රගණ්‍ය නිර්මාණය වූ කව්සිළුමිණෙහි කතුවරයා වන්නේ ද දෙවන පරාක්‍රමබාහු රජතුමා වීමයි. දඹදෙණි කතිකාවතින් කාව්‍ය නාටකාදී ගර්හිත විද්‍යාවන්හි නිරත වීම භික්ෂූන් වහන්සේට තහනම් කරවීම මඟින් වක්‍ර මාර්ගයෙන් රාජසභාව ඇතුළු ප්‍රභූ කවීන්ටද තහනම් කළ බව පැහැදිලිය. මෙම යුගයේ භික්ෂූන්ගෙන් වැඩි කොටසක් සසුන් මඟ මුළුමනින් ම අමතක කොට ගිහි මඟ ගත් නිසා ම මෙම කතිකාවත සම්පාදනය වූ වග "ඒ ඒ තැන ප්‍රමාදව වසන ශාසනාවචර බොහෝ පුද්ගලයන්ගේ පරිහානිකර වූ අප්ප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්ති බාහුල්‍ය දැක... (කතිකාවත් සඟරා, 1989: 11) යන කතිකාවත් පාඨය සනාථ කරයි. හිරිඔතප් නැති සමහර පුද්ගලයන්ගේ බාහුල්‍ය නිසා ශාසනය දූෂිත වූ බව අනුරාධ සෙනවිරත්න මහතාගේ මතයයි (සෙනවිරත්න, 1990: 04) මහාචාර්ය ඇම්. බී. ආරියපාල මහතා ද ඒ පිළිබඳ ව එම අදහසම දරයි (2014: 3).

දඹදෙණි කතිකාවත මඟින් භික්ෂූන් වහන්සේට පැනවූ නීති රීති තම ශ්‍රාවකයින් කෙරෙහි ද යොමු කරවීමට එකල ලේඛකයෝ මහත් සේ උත්සාහ ගත්හ. සද්ධර්මරත්නාවලියෙහි එන තඹදැලි නම් සොරාණන්ගේ වස්තුවෙන් උපුටා ගත් මේ ප්‍රකාශයෙන් එය තහවුරු වේ. එහෙයින් සත්පුරුෂයන් විසින් කාව්‍ය නාටකාදී නිෂ්ප්‍රයෝජන කතා හැර නිවනට පමුණුවාලිය හෙන්නා වූ බණ කතාව ගොදුරු කොට වසන්නට උත්සාහ

කටයුතු (සද්ධර්මරත්නාවලිය, 1961: 590).

දඹදෙණි කතිකාවත පිහිටුවීමෙන් අනතුරු ව ලෞකික පක්ෂයට නැඹුරුව කාව්‍යකරණයෙහි යෙදී සිටි භික්ෂූන් වහන්සේගේ කාව්‍යකරණය කෙරෙහි වූ උනන්දුව පාලි සාහිත්‍ය කෙරෙහි නැඹුරු කරවූ අයුරු පැහැදිලිය. සංඝරක්ෂිත හිමියන් විසින් රචනා කරන ලද සුබෝධාලංකාරය පාලි අලංකාර ශාස්ත්‍රීය නිර්මාණයක් වේ. එය සංස්කෘත අලංකාරවාදය වෙනත් අයුරකින් හඳුන්වා ආගමික සාහිත්‍ය වර්ධනය කිරීමට යත්න දැරූ ආකාරය පැහැදිලිය. සංඝරක්ෂිත හිමියන් පාලියෙන් අලංකාරවාදය ඉදිරිපත් කිරීමේ දී එය ධර්ම සාහිත්‍යය කෙරෙහි පමණක්ම යොමු කිරීමට වගබලා ගත් බව පෙනේ.

තෙ යෙව පටි භාවන්තො - සොව බන්ධො සවිම්හයො

යෙන තොසන්ති විඤ්ඤූයෙ - තථාපථ්‍යපා විහිතාදරා

යම් කෙනෙකුන් තුමූ ඒ කාව්‍ය නාටකයන්හි නොකරන ලද ආදර ඇත්තාහු නමුදු යම් කාව්‍ය ස්වරූප වූ බන්ධනයකින් විඤ්ඤූ ජනයන් සතුටු කරවත් ද ඔවුහු ප්‍රතිභා සංඛ්‍යාත නුවණ ඇත්තාහු වෙති. ඔවුන්ගේ එම බන්ධනයම විස්මය සහිත වේ (සුබෝධාලංකාරය, 1934: 6-7).

පූර්වෝක්ත සුබෝධාලංකාර උද්ධෘතයන්ගෙන් දඹදෙණි අවධියේ කාව්‍ය නාටකයන්ට වූ විරෝධයත් ඒ ආශ්‍රයෙන් ආගමික සාහිත්‍ය වර්ධනය කිරීමට දැරූ ප්‍රයත්නයත් වටහා ගත හැකි යි. මේ අයුරින් ක්‍රමානුකූල ව සකස් කරන ලද ක්‍රියා පටිපාටියකට අනුව ලෞකික සාහිත්‍ය සම්ප්‍රදාය පිටුදැකීමට යතිවරයන් වහන්සේ උත්සුක වූ අයුරු මධ්‍යකාලීන සිංහල සාහිත්‍යය දෙස බලන විට පැහැදිලිව පෙනේ.

යුරෝපීය ඉතිහාසය හැදෑරීමේ දී විද්වතුන් විසින් යොදා ගනු ලබන ප්‍රධාන බෙදීම් ත්‍රිත්වය වන පැරණි, මධ්‍යතන සහ නූතනය යන යුග අතුරින් දෙවන යුගය වන මධ්‍යතන යුගයේ කාලසීමාව වනුයේ රෝම අධිරාජය බිඳ වැටීම හෙවත් පස්වැනි

සියවසේ සිට කොන්ස්තන්තිනෝපලය තුර්කින් යටතට පත්වීම සිදුවූ 15 වැනි සියවස දක්වා බව කියැවේ. සාම්ප්‍රදායික විද්වත් මතවාදයන්ට අනුව ඔවුන් විසින් හඳුන්වා ඇත්තේ යුරෝපයේ රටවල් පරිහානිය පිළිබිඹු කළා වූ ද, ශිෂ්ටත්වයට වඩා ම්ලේච්ඡ ලක්ෂණ දෘෂ්‍යමාන කළා වූ ද, බුද්ධි ප්‍රභවයට වඩා මූඪත්වය හා මමත්වය එළිදරව් කළා වූ ද යුගයක් ලෙසිනි.

පැරණි රෝම සභ්‍යත්වය පැවති සමයේ ආරම්භ වූවා යැයි සැලකෙන කිතු දහම ක්‍රිස්තු වර්ෂ 5න් ආරම්භ වන නව යුරෝපා ශිෂ්ටාචාරයේ, එනම් මධ්‍යතන අවධියේ අඳුරුබව නැසීම සඳහා උපයෝගී වූ ප්‍රධාන ආගමික මාර්ගය වූ බව පැහැදිලිය. මේ අනුව පැහැදිලි වන්නේ කිතු දහම මධ්‍යතන අවධියේ ආගමික පදනම වූවා පමණක් නොව, මධ්‍යතන සමාජ දේශපාලන කටයුතුවලට ද මහත් බලපෑමක් එල්ල කර වූ දර්ශනයක් ද වූ බවය. විශේෂයෙන්ම මධ්‍යතන අවධියේ සමාජයේ පැවති මූලික දේශපාලන චින්තනයන් කිතු දහම පදනම් කොටගෙන පරිවර්තනයකට ලක් වූ බව පෙනේ. එමෙන් ම මධ්‍යතන සමාජය ඉතා වේගයෙන් කිතු දහමේ ඉගැන්වීම් අනුව මනුෂ්‍ය සහෝදරත්වය, අන්‍යෝන්‍ය විශ්වාසය ආදි සංකල්ප සිය ජීවන ක්‍රමවේදයන්ට අනුගත කරගත් බව පෙනේ. එනම් ලෝකයේ පවතින උස් පහත්කම් දෙවියන් අභිමුවෙහි අහෝසි වන්නේ වන්නේය, යන කිතු දහමේ මතය හේතු කොට ගෙන, මනුෂ්‍යයා සියල්ලන්ගේ ම ශ්‍රේෂ්ඨතමයා, බව මධ්‍යතන වැසියන් ඇදහූ බව පැහැදිලි වේ. එමෙන් ම මධ්‍යතන සමාජය තුළ රාජ්‍ය ආගම බවට පත්වීමට ක්‍රිස්තියානි ආගමට හැකියාවක් ලැබිණි. මෙම යුගයේ ඉහළ ම වර්ධනයක් අත් කොටගත් දේශපාලන සමාජ හා සංස්කෘතිකාංග අනුගමනය කළ රාජ්‍යයන් වූ බව ද පෙනේ. එහෙයින් ක්‍රිස්තියානි ආගම යනු මධ්‍යතන අවධිය ජීවග්‍රාහයෙන් පවත්වාගෙන යාමට සමත් වූ ආගමික දර්ශනය වූ බව ප්‍රත්‍යක්ෂ කරුණකි.

මධ්‍යතන අවධියේ යුරෝපය විසින් ලෝක ශිෂ්ටාචාරයට දායාද කරන ලද වැදගත්ම දේ වූයේ විශ්වවිද්‍යාල අධ්‍යාපන ක්‍රමය යි. ඒ අනුව තාපසාරාම මුල් කරගත් අධ්‍යාපන ක්‍රමය ව්‍යාප්ත වී

යත් ම, මූලික ව ලතින් භාෂාව හා අරාබි, ග්‍රීක ආදි භාෂාවන් ද, පදනම් කොටගත් ග්‍රන්ථ භාවිතයට මධ්‍යතන සමාජය හුරුවීම මෙහි දී සිදු විය. මේ ග්‍රන්ථ පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී ඒවායේ ඇති විදග්ධභාවය මධ්‍යතන සමාජය කිසිදු ආකාරයක අඳුරු ලක්ෂණ පෙන්නුම් කළ යුගයක් නොවන බව මැනවින් තහවුරු කරයි. මේ යුගයේ රචනා කරන ලද කෘති අතර මහා ඇල්බට්ගේ කෘති, ශාන්ත ඇක්වයිනාස් දේවගැතිවරයාගේ කෘති, රොජර් බේකන්ගේ කෘති ආදිය වැදගත් තැනක් ගනී. එමෙන් ම ඉතාලි ජාතික ඩාන්ටේ විසින් රචිත කෘති සහ පියෝෆ් චෝසර්ගේ කෘති ලෝක සාහිත්‍යයේ විශිෂ්ට කෘති ලෙසින් සම්භාවනාවට පාත්‍ර වේ.

මධ්‍යතන යුගයේ දී හා ඉන් ඔබ්බට නිර්මාණය වූ කෘතීන් සියල්ල ම අන්තර්ගත මධ්‍යතන යුගයේ සාහිත්‍ය පුළුල් විෂයයකි. මෙම කාලය සාහිත්‍යමය ආනුභාවික ලිවීම්වලින් මෙන් ම අගාරික නිර්මාණවලින් ද යුක්ත විය. එය පොහොසත් හා සංකීර්ණ විෂය ක්ෂේත්‍රයක් විය.

මේ යුගයේ බහුලව දක්නට ලැබුණේ දේව ධර්මය පිළිබඳ ග්‍රන්ථයන් ය. එසේ වීමට හේතු වූයේ එකල සමාජයේ කේන්ද්‍රස්ථානය කතෝලික පල්ලිය ද බැවිනි. තෝමස් ඇක්වයිනාස් හා පියරි ඇබලාර්ඩ් වැනි ආගමික විද්වතුන් දේව ධර්මය මෙන් ම දේව දර්ශනය පිළිබඳ ව ඉතා දිගු නිබන්ධ ග්‍රන්ථාරූඪ කරන ලදි. මේ යුගයේ ලෞකික සාහිත්‍යය, ආගමික ආකාරයෙන් පළ නොවූ නමුත් බොහෝමයක් අදටත් පවතී. කෙසේ නමුත් මෙම ශාස්ත්‍රීය ලිපියේ දී පර්යේෂකයාගේ අරමුණ වන්නේ, මධ්‍යතන යුගයේ ආගමික සාහිත්‍ය සමාජ දේශපාලන ස්ථර කෙරෙහි දැක්වූ බලපෑම පිළිබඳ විචාරාත්මක විග්‍රහයක යෙදීම ය.

කතෝලික දර්ශනය යනු ශුද්ධ වූ අගෝස්තීනු පටන් පුනරුදය දක්වා යුරෝපීය චින්තනය කෙරෙහි බලපෑ දර්ශනය විය. මධ්‍යතන යුගය හැටියට අප සලකන ක්‍රිස්තු වර්ෂ 400 පමණ සිට ක්‍රිස්තු වර්ෂ 1400 පමණ දක්වා වූ අවධියට පෙර හෝ පසු

ව කවදාවත් නොසිතූ පරිදි ක්‍රිස්තියානි සභාව එම කාලය තුළ දී දාර්ශනික විශ්වාසයක්ද සමාජ හා දේශපාලන කරුණු අතර සමීපතර සම්බන්ධතාවක් ද ඇති කළ බව පැහැදිලි ය. ක්‍රිස්තියානි සභාව වූ කලී තරමක් දුරට දාර්ශනික වූ ද, තරමක් දුරට ආගමික ඉතිහාසය හා සම්බන්ධ වූ ද ඇදහිල්ලක් මත ගොඩනැඟුණු සමාජ ආයතනයකි. එයට ඇදහිල්ල මඟින් බලය හා වස්තුව ලැබිණි. එය හා නිතර සට්ටනය වූ ගිහි පාලකයෝ පරාජයට පත්වූහ. කවර හෙයින් ද යත් බොහෝ ගිහි පාලකයන්ද, අතිවිශාල බහුතර ජනතාවක්ද කතෝලික ලබ්ධියේ සත්‍යතාව ගැන ඒකාන්ත වශයෙන්ම පිළිගෙන සිටි හෙයිනි (රසල්, 2015: 331).

මෙම කාලයේ දී බුද්ධි විෂයක ක්ෂේත්‍රයෙහි දියුණුවට ක්‍රියාකළ හැමදෙනා ම ආගමික පූජකවරු වූහ. මධ්‍යතන යුගයෙහි ගිහි ජනතාව ප්‍රබල දේශපාලන හා ආර්ථික පද්ධතියක් ගොඩනැඟූහ. ඒ අතර මධ්‍යතන යුගයේ දී කතෝලික සභාවේ සාහිත්‍යයට අතිශයින් වෙනස් වූ ගිහි සාහිත්‍යයක් ද තිබුණි. ඩාන්ටේ තෙක් කිසිම ලේඛකයෙක් තම කාලයේ ආගමික දර්ශනය පිළිබඳ ව සම්පූර්ණ දැනුම සහිතව නොලීවේය. 14 වන සියවස දක්වා සම්පූර්ණයෙන් ම වාගේ තනි අයිතිය තිබුණේ ක්‍රිස්තියානි ආගමික පූජක පක්ෂය අතේය. එබැවින් දර්ශනය ගැන ලියා ඇත්තේ ක්‍රිස්තියානි දෘෂ්ටිකෝණයෙනි.

බටහිර යුරෝපයෙහි බුද්ධි විෂයක ක්‍රියා මුළුමනින් ම වාගේ නොපැවැත්වෙන්නා වූ අඳුරු යුගයන් මඟින් කතෝලික දර්ශනය කාලපරිච්ඡේද දෙකකට බෙදනු ලැබ ඇත. කතෝලික දර්ශනයේ ප්‍රථම ශ්‍රේෂ්ඨ යුගයේ දී ශුද්ධ වූ අගෝස්තීනු අග්‍රගණ්‍ය සේ සැලකුණු අතර මිථ්‍යා දේව දෘෂ්ටිකයන් අතර ප්ලේටෝ ප්‍රමුඛ විය. දෙවන කාල පරිච්ඡේදයේ දී ශුද්ධ තෝමස් ඇක්වයිනාස් අග්‍රස්ථාන වූ අතර එතුමාත්, එතුමාගේ ආනුභාවිකයෝත් ප්ලේටෝට වැඩියෙන් ඇරිස්ටෝටල් උසස් කොට සැලකූහ.

අතිවිශාල වශයෙන් ලියූ ලේඛකයෙකු වූ ශුද්ධ වූ අගෝස්තීනු ප්‍රධාන වශයෙන්ම ලියූවේ දේව ධර්මානුකූල විෂයන්

ගැන ය. එතුමාගේ ඇතැම් විවාදාත්මක කෘති තත්කාලීන විෂයාත්‍රික වූ අතර ඒවායේ සාර්ථකත්වය නිසා ම ඒවා ගැන උනන්දුව හීන විය. අගෝස්තීනුගේ කෘති අතර හොඳම ශුද්ධ දර්ශන ග්‍රන්ථය Confessions හි එකොළොස් වැනි කාණ්ඩය යි. ලෝක නිර්මාණය පිළිබඳ ව ප්ලේටෝ වැන්නන් කරන ප්‍රකාශයන්ට විරුද්ධව තර්ක කරන අගෝස්තීහි දෙවියන් වහන්සේගේ පිළිවෙළ හා න්‍යාය පමණක් නොව ද්‍රව්‍යාර්ථය ද මැවීය යන්න සඳහන් කර සිටියේ ය.

ශුද්ධ වූ අගෝස්තීනු මධ්‍යතන යුගය පුරාම බටහිර අධිරාජ්‍යයට එහි ප්‍රතිපත්තියේ සෛද්ධාන්තික යුක්ති සහගතතාව සපයා දෙන ලදී. "The city of god" ඔහුගේ කෘති අතර බෙහෙවින් වැදගත්කමක් උසුලයි. ආගමික හා ලෞකික ඉතිහාසය අතර වෙනස පුරාණ ගිවිසුමෙහි පැහැදිලි ව එන්නකි. ශුද්ධ වූ අගෝස්තීනු කළේ මේ අංගයන් එක් කොට ඒවා තමාගේ සටනේ ඉතිහාසය සමඟ සම්බන්ධ කර දැක්වීම යි. එතුමා එසේ කළේ තම භක්තිය කෙරෙහි පමණට වැඩි හිරිහැරයක් ඇති නොවන සේ බටහිර අධිරාජයේ වැටීමත් ඉන්පසු ඇති වූ වියවුල් සමයත් ක්‍රිස්තියානින් හට සමාග්‍රහණය කළ හැකිවන පරිද්දෙනි.

සයවැනි සියවසේ දී සංස්කෘතික ඉතිහාසය සම්බන්ධයෙන් ඉතා වැදගත් සිව් දෙනෙක් වූහ. එනම් බොයිතියස්, ජස්ටීනියන්, බෙනඩික් සහ මහා ග්‍රෙගරිය. ඉතාලියේ ගොතික් ජයග්‍රහණය නිසා රෝම සභ්‍යත්වය මුළුමනින් ම වැනසී ගියේ නැත. ඉතාලියේ සහ ගොතික්වරුන්ගේ රජ වූ තියඩෝරික් ඉතාලියට සාමය හා ආගමික සහනය තිබුණේය. තියඩෝරික් ඒරියානුවාදියෙක් වුවද ඔහුගේ අවසාන වර්ෂ කිහිපය දක්වා හෙතෙම ක්‍රිස්තියානි සභාව හා සුහදතාවේ පසුවිය. දේවධාර්මික සහයෝගය නිසා අධිරාජ්‍යයාගේ පස ගැනීමට ඔහුට සිදුවිය. හරි හෝ වැරදි ලෙස තම ආණ්ඩුවේ රාජපුරුෂයන් සම්බන්ධ වූ කුමන්ත්‍රණයක් වී යැ යි ඔහු විශ්වාස කළේය. මේ නිසා ඔහු තම ඇමතියෙකු වූ සැනෙට් සභික බොයිතියස් (Boethius) සිරකොට පසු ව මරණයට පැමිණවීය. ඔහු ලියූ දාර්ශනික ග්‍රන්ථය, Consolation of philosophy, නම් කෘතිය කළේ බන්ධනාගාරයෙහි සිටිය දී ය. ඔහුගේ කෘති මධ්‍යකාලීන

යුගය පුරා කියවනු ලැබීය. භක්තිමත් ක්‍රිස්තියානිකයෙකු වශයෙන් සලකනු ලැබූ ඔහු ක්‍රිස්තියානි පීතෘවරයෙකු තරම් කොට සලකන ලද්දේ විය. එහෙත්, Consolation of philosophy, ග්‍රන්ථය හුදු ප්ලේටෝනික කෘතියක් විය. මෙම කෘතිය ගද්‍යයෙන් හා පද්‍යයෙන් ලියැවී ඇත. ගද්‍යයෙන් කතාකරන අතර දර්ශනය පද්‍යයෙන් පිළිතුරු දෙයි. එහි ඩාන්ටේ හට එක්තරා සමානකමක් දක්නට ලැබේ. Vita Nuova හී ඔහු නිසැකව ම බොයිතියස්ගේ බලපෑමට යටත්ව ඇත. මෙහි හුදු ප්ලේටෝනික ආධ්‍යාත්මික කරුණු රැසකි. මරණ දඬුවමට නියමව සිපිරි ගෙය තුළ සිටිය දී ලියන ලද එය සොක්‍රටීස්ගේ අවසාන මොහොත තරම්ම උදාර ය.

මෙය දර්ශනය අතින් පොප්ගේ "Essay on man" නමැති කෘතියට බෙහෙවින් සමානය. ක්‍රිස්තියානි ආගමේ බලපෑමෙන් බිහිවූ මධ්‍යකාලීන ක්‍රිස්තියානි ලතින් සාහිත්‍ය වංශකතා, නීති ග්‍රන්ථ, පද්‍ය ලේඛන, දාර්ශනික ලේඛන හා ආගමික ග්‍රන්ථ යන අංශවලින් පරිපූර්ණ වූ බව ඉතා පැහැදිලි ය. ටෙර්ට්‍රලියන් (Tertallian), මිනිසියස් (Minucius), ෆිලික්ස් (Felix), කප්රියන් (Cyprian), අර්නොබියුස් (Amobius), ලක්ටන්ටියුස් (Luctantius) මේ සාහිත්‍යයෙහි ප්‍රධාන තැනක් ගන්නා ලේඛකයෝ ය. ඉසිදෝරේ ලියූ එටීමොලොජියායී (Etymologiae) පරම්පරා ගණනාවකටම විශ්වකෝෂයක් බඳු විය. තෝමස් ඇක්වයිනාස් (Thomas Aquinas), රොජර් බේකන් (Roger Bacon) සහ ඇල්බර්ටිනෝ මුස්සතෝ (Albertino Mussato) ආදීහු මේ කාලයේ කැපී පෙනෙන ලේඛකයෝ ය.

ශාන්ත තෝමස් ඇක්වයිනාස් දේව ධර්මය හා දර්ශනය, ආධ්‍යාත්ම විද්‍යාව, ආචාර ධර්මය හා රාජ්‍යතන්ත්‍රය ගැන මහත් සැලකිල්ලක් දැක්වීය. දේවධර්මඥයෙකු මෙන් ම දාර්ශනිකයෙකු ද වූ ඇක්වයිනවස් දේව ධර්මයත් දර්ශනයත් එකිනෙක හා සමීපාර්ශයට පැමිණවීය. එතුමා දෙවියන් වහන්සේ හා ප්‍රේමයෙන් පසු වූ පරිපූර්ණ බුද්ධිමතෙකු විය. බුද්ධිවාදයෙන් තෘප්තියට නොපත් එතුමා ආගමික අධිකාරයේ සරණ ඊට ආදේශකයක් වශයෙන් යොදාගත හැකි යැ යි කිසිසේත් නොසිතීය. සුම්මා කොන්ත්‍රා

ජෙන්ටිලීස්" (Summa Contra Gentiles) නම් ග්‍රන්ථයෙහි ස්වභාව හේතුන් පිළිබඳ ක්ෂේත්‍රය භක්තිය පිළිබඳ ක්ෂේත්‍රයෙන් වෙන් කිරීමෙන් ක්‍රිස්තියානි නොවන්නන්ගේ විරුද්ධවාදී තර්කයන්ට එතුමා පිළිතුරු දෙයි.

තෝමස් ඇක්වයිනාස්ගේ ඉතා ම වැදගත් කෘතිය වූ Summa Contra Gentiles ලියන ලද්දේ ක්‍රිස්තු වර්ෂ 1959 - 64 කාලයේ දීය. එය වනාහී ක්‍රිස්තු භද්තිකයෙකු නො වන පාඨකයකු අමතා කරන තර්කනයකින් ක්‍රිස්තියානි ආගමේ සත්‍යභාවය ඔප්පු කරන අදහස් වලින් ලියන ලද්දකි. ඇරිස්ටෝටල්ගේ කෘතිවල මෙන් අවිචාලිත චාලකයාණන් පිළිබඳ තර්කනයෙන් එතුමා දෙවියන් වහන්සේගේ සත්තාව ඔප්පු කරයි. Summa Theologica හි දෙවියන් වහන්සේගේ සත්තාව පිළිබඳ සාධන පහක් දී ඇත. ප්‍රථම කොට ඉහත දැක්වූ අවිචාලිත චාලකයාණන් පිළිබඳ තර්කය යි. දෙවනුව මූල හේතුව පිළිබඳ තර්කයයි. තෙවනුව සකල අවශ්‍යතාවන්ට පරියෝසාන ප්‍රභවයක් විය යුතු ය යන්නයි. සිව්වනුව ලෝකයෙහි විවිධ පාරප්‍රාප්තීන් විද්‍යාමාන ය. මේවා සම්පූර්ණයෙන් ම පරප්‍රාප්තීන් කරා ගිය යම්කිසිවක් ප්‍රභව කොට ඇත්තේ විය යුතුය යන්න යි. පස්වනුව අජීවී දෙයට පවා අරමුණක් ඇති බව ය.

මේ Summa Theologica ඔහුගේ කෘතියෙහි එන ප්‍රකාශයකි.

"Where any creature can be like god! Objection 1( I seems that no creature can be like god' For it is written (ps 85'8) "There is none among the gods like unto thee" O load" "But of all creatures the mot excellent are thoe which are called participation gods' Therefore still can other creatures be said to be like god…" (Summa Theologica, 1947).

සුම්මා තියොලොජිකා (Summa Theologica) නම් ග්‍රන්ථයෙහි හා අන් තැන් වලත් ඇක්වයිනාස් තම ආචාර ධර්මය විකාශනය කරයි. සදාචාර ක්‍රියා (Actus Humani) වූ කලි සදාචාර

ඉක්මවා සිටින නිෂ්ඨාවක් කරා එළඹීමට යෝග්‍ය වන පරිද්දෙන් යොදාගත යුතු යැ යි ඔහු ප්‍රකාශ කරයි. බුද්ධිවාදියෙකු වූ එතුමා ඥානයේ ක්‍රියාවක් මඟින් සන්තෘෂ්ටිය ග්‍රහණය කළ හැකි යැ යි ද, ඒ ලබා ගැනීම සම්බන්ධයෙන් දූරදර්ශීතාව අන්‍යයන්ගෙන් උපස්ථම්භක වේ යැ යි ද විශ්වාස කළේය.

සෞන්දර්ය පිළිබඳ ව ඔහු මෙසේ ප්‍රකාශ කළේය. සුන්දරත්වය යනු සාධුත්වයමයි. එය වෙනස් වන්නේ අංශකවලින් පමණි. සාධුත්වය යනු සියලු දෙනාටම පතන දෙය හෙයින් එය අභිලාසය සමනය කරන දෙයයි. ඒ අනුව පැහැදිලි වන්නේ ඇක්වයිනාස් සෞන්දර්ය යන්න නිර්වචනය කරන්නේ දුටු කල්හි සුඛාස්වාදය ගෙන දෙන දෙයක් යනුවෙනි.

මෙම යුගයේ දක්නට ලැබෙන අනෙක් වැදගත් ලේඛකයා වන්නේ රොජර් බේකන්ය (1214-1294). Opus, Mojus, Opus Minus, Opus Tertium yd Compendium Study Philosophiae යන ග්‍රන්ථයන් රචනා කළ ඔහු පූජක අඥානභාවයට (අවිද්‍යාවට) පහර දුන්නේය.

සුප්‍රකට ලේඛකයන් දෙදෙනෙකු වූ ඩාන්ටේ සහ චෝසර් මධ්‍යතන යුගයේ සාහිත්‍යය ප්‍රබෝධමත් කළ දෙදෙනෙකි. ඩාන්ටේ අලිග්‍රේරි ක්‍රිස්තු වර්ෂ 1265 දී ඉතාලියේ ෆ්ලොරෙන්ස් නගරයේ ඉපිද ලතින් භාෂාවෙන් කෘති රචනා කළේය. ඩාන්ටේගේ විශිෂ්ටතම කෘතිය "ඩිවයින් කොමඩි" (The Divine Comady) නම් ග්‍රන්ථයයි. එහි අන්තර්ගතය වන්නේ වර්ජිල් නම් රෝම කිවිවරයා විසින් ඔහුට මඟ පෙන්වූ වන්දනා ගමනක් ගැන කියවන කතාවකි. අපාය හා ස්වර්ගය අතර ගිය ගමනක් විස්තර වන මෙහි යහපත් හා අයහපත් දෙපිරිස ම හමුවේ. තමා විසූ සමාජය විවේචනය කිරීමට උත්සාහ දරා ඇති මේ කෘතිය ඔහු විසූ සමාජය පිළිබිඹු කරන කැඩපතක් බඳු ය.

පියෝෆ්‍රි චෝසර් ක්‍රි. ව. 1340 දී එංගලන්තයේ ඉපිද "කැන්ටබරි ටේල්ස්" (Canterbury Tales) නමින් කතා සංග්‍රහයක් රචනා කළේය. මෙහි අන්තර්ගතය වන්නේ වන්දනාකරුවන්

පිරිසක් කැන්ටබරියේ තෝමස් ආ බෙකට්ගේ (Thomas a Beckets) දේවස්ථානයට යන වන්දනා ගමනක් පිළිබඳව ය. මෙහි දී ඔහු උත්සාහ දරා ඇත්තේ උපහාසාත්මක කතා අනුසාරයෙන් පූජකවරුන් උපහාසයට ලක් කිරීමයි. ඔහුගේ රචනාවල පැවති ප්‍රසාදජනකභාවය නිසා ඔහු ඉංග්‍රීසි භාෂාවේ පුරෝගාමියා වශයෙන් සැලකේ.

මේ සියලු ආගමික සාහිත්‍ය කෘතින්ගෙන් පැහැදිලි වන්නේ කිතු දහම මධ්‍යතන සමාජයේ සමාජ දේශපාලන කටයුතුවලට මහත් බලපෑමක් එල්ල කර වූ බවයි. මෙම යුගයේ ඉහළම වර්ධනයක් අත්පත් කරගත් බොහෝ අධිරාජ්‍යයන් කිතු දහම පදනම් කොටගත් දේශපාලන සමාජ හා සංස්කෘතිකාංග අනුගමනය කළ බව ඉහත නිදසුන්වලින් මනාව පැහැදිලි වේ.

මේ අනුව එකම යුගයක එකිනෙකට වෙනස් ආගමික හා සංස්කෘතික වටපිටාවක් සහිත ශ්‍රී ලාංකේය හා යුරෝපීය සමාජ නියෝජනය කරන සාහිත්‍ය කෘති විචාරාත්මක ව විමර්ශනය කිරීමේ දී පැහැදිලි වන්නේ මේ ප්‍රාචීන හා ප්‍රතිචීන සමාජ දෙකෙහිම සමානතා මෙන් ම අසමානතා ද පවතින බවයි. එය ආගමික, දේශපාලනික මෙන් ම සමාජීය යන අංශ යටතේ විග්‍රහ කළ හැකි ය.

මධ්‍යකාලීන සිංහල හා යුරෝපීය සාහිත්‍ය ඉතිහාසය දෙස විමසිල්ලෙන් බැලීමේ දී පැහැදිලි වන එක් කරුණක් තිබේ. එනම් මෙම ප්‍රාචීන හා ප්‍රතිචීන සමාජ දෙකෙහි ම සාහිත්‍යයන් පරමාර්ථ අතින් එක හා සමාන වන බව යි. ඉහතින් සඳහන් කළ ලෙස ම මධ්‍යකාලීන සිංහල සාහිත්‍ය බෞද්ධ සම්ප්‍රදායන් හා අදහස් උදහස්වලින් සම්පූර්ණයෙන් ම වෙලීගිය එකක් බව ඉතාමත් පැහැදිලි ය. එමෙන් ම සියලු සමාජ ක්‍රියා පටිපාටි සහ සමාජීය සංකල්පනය සම්පූර්ණයෙන් ම රජය හා සම්බන්ධ බලසම්පන්න සංඝ සමාජයේ බලපෑම්වලට යටත් වූ බව ඉතා පැහැදිලිය. දඹදෙණි යුගය වන විට ගිහි සම්ප්‍රදාය සම්පූර්ණයෙන් ම යටත් කොට යති සම්ප්‍රදායේ වර්ධනය කරවීමෙහිලා අතිවිශාල බලපෑමක් කරන

ලද්දේ භික්ෂූන් වහන්සේ ය. සංඝ ආධිපත්‍යය රැකගැනීම හා එහි ලෞකික පදනම සැපයීම රජය සතු වගකීමක් වූ බව II වන පරාක්‍රමබාහු රජු විසින් පැනවූ දඹදෙණි කතිකාවතෙන් මනාව පැහැදිලි විය. මේ ලෙසින් බලන කල මධ්‍යකාලීන සිංහල සාහිත්‍ය මධ්‍යකාලීන යුරෝපීය සාහිත්‍ය හා දැඩි සමීපතාවක් දැකිය හැකි ය. මේ සඳහා දිය හැකි හොඳම නිදසුන තෝමස් ඇක්වයිනාස් විසින් රචිත සුම්මා තියොලොජිකා නම් ග්‍රන්ථය යි. මෙහි දක්වා තිබෙන ක්‍රිස්තු ධර්ම රාජ්‍යය පිළිබඳ සංකල්පය හා මධ්‍ය කාලීන සිංහල සාහිත්‍ය අතර ඉතා පැහැදිලි සාදෘශ්‍යතාවක් පෙනෙන්නට ඇත. එහි පෙනෙන දේව ධර්ම විවරණයෙන් අභිප්‍රේත වන්නේ බුද්ධියත් ලෝකෝත්තර ශ්‍රැතියත් අතර සංකල්පනයක් විදහා පෑම ය. මනුෂ්‍යයාගේ ක්‍රියා පටිපාටියෙහි විවිධත්වය කෙරෙහි ඒකාග්‍රතාවක් පැනවීම හා මිනිස් පැවැත්මේ යුක්තිය යුක්තතාව ඇති වන්නේ දේව භක්තිය නිසා ම යැ යි පෙන්වීම මෙම කෘතියේ පරමාර්ථය විය. ලෝකය හුදු මසින් ලෙයින් හා දුෂ්ටත්වයෙන් පිරුණක් පමණක් නොව මායාවක් ද වේ. බෞද්ධයා තමා දෙස බැලුවේ ස්වසන්තාන දමනයෙන් තමන් අභිබවා ගැනීමෙන් ජයගත යුතු ය යන හැඟීමෙනි. මධ්‍යකාලීන සිංහල සාහිත්‍යයෙහි පැහැදිලිව පෙනෙන්නේ මෙකී ලක්ෂණයයි. මධ්‍යකාලීන ලාංකේය සහ යුරෝපීය සාහිත්‍යය දෙස බැලීමේ දී අවසාන වශයෙන් පැහැදිලි වන්නේ මේ සාහිත්‍ය සමාජ දෙක ම සාහිත්‍ය ඇතුළු සකල කලාවම සාර්වභෞමික මෝචන කෘත්‍යයකින් සමත් විය යුතු බව තේරුම්ගෙන සිටි බව යි. සාර්ව භෞමික වශයෙන් මිනිසා මිදීමේ කෘත්‍යය කලාවට හිමිව ඇති බවය. උසස් කලාව ආගමික පරිසමාප්තියකින් කෙළවර වන බව මයිකල් ආන්ජිලෝ තම අවසන් විනිශ්චය, නම් කෘතියෙන් පෙන්වා දී තිබේ. සැබැවින් ම මධ්‍යකාලීන බෞද්ධ සාහිත්‍යයෙන් මෙන් ම යුරෝපීය සාහිත්‍යයෙන් ද පැහැදිලිව ම පෙන්වා ඇත්තේ ආගමින් මිනිසාට ආධ්‍යාත්මික රක්ෂණයක් ද ලද හැකි බවයි. අභ්‍යන්තරික ජීවන සන්තුෂ්ටිය ප්‍රමෝදය පිළිබඳ හැඟීම් මත ආත්මය ප්‍රබෝධයට පත් කළ හැකි වන්නේ කලාවෙන් බව මධ්‍යකාලීන ලාංකේය සහ යුරෝපීය සාහිත්‍ය මනාව පෙන්වා දී තිබේ.

# ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

## ප්‍රාථමික මූලාශ්‍රය

### සිංහල


*කර්ම විභාගය*, (1961). විමලකිත්ති ස්ථවිර මැද උයන්ගොඩ, නැහින්නේ සොමිනන්ද ස්ථවිර. කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

*සද්ධර්මරත්නාවලිය*, (1961). ඥානවිමල, කිරිඇල්ලේ, කොළඹ 11 ඃ ඇම්.ඩී. ගුණසේන සහ සමාගම

*සුබෝධාලංකාරය*, (1934). ශ්‍රද්ධාතිස්ස හිමි, බෙන්තර, කොළඹ 11 ඃ ඇම්.ඩී. ගුණසේන සහ සමාගම

*සංයුත්ත නිකාය*, (1941). අමරසීහ හිමි, බණ්ඩාරමුල්ලේ, කොළඹ


### ඉංග්‍රීසි


Summa Theologica, 1947. Benziger Bros edition Translated by fathers of the English Dominican province


## ද්විතියික මූලාශ්‍රය


ආරියපාල, ඇම්. බී. (2014). *මධ්‍යකාලීන ලංකා සමාජය.* කොළඹ. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ජයතිලක, ඩී. බී. (2002). *කතිකාවත් සඟරා.* කොළඹ. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

රසල්, බර්ටන්ඩ් (2015). *බටහිර දර්ශන ඉතිහාසය.* බත්තරමුල්ල ඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

වික්‍රමසිංහ, මාර්ටින්. (1997). *සිංහල සාහිත්‍යයේ නැගීම.* දෙහිවල, තිසර මුද්‍රණාලය

සූරවීර, ඒ. වී. (1998). *සිංහල සාහිත්‍ය සම්ප්‍රදාය.* රාජගිරිය. කුරුලු පොත්.


### සඟරා


*මහා විහාර වංශය.* රඹුක්වැල්ලේ විපස්සී මල්වතු නා හිමි. උපහාර කලාපය. 1990.